# 2019 අගෝස්තු මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පැවති ජීවිතාකල්පය ම ඔබ තුළත් පවතීවා !**
( පිලිප්පි 2:5)

ක්‍රිස්තියානි කාරයා යනු ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය සහ උත්ථානයෙන් ලැබුනු ගැළවීමට පංගුකාර වී දේව පුත්‍රභාවයේ උරුමයට සහභාගී වීමට වරම් ලත් තැනැත්තා ය. එම නිසාම ඔහුට හෝ ඇයට දෙවියන් වහන්සේට අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ යයි ඇමතීමට ශුද්ධාත්මයාණෝ වරම් දී ඇත. ( රෝම 8:14)

**එසේ නම් සෑම ක්‍රිස්තියානි කාරයෙකු තුළම ශුද්ධවූ පාවුලු තුමා පිලිප්පිවරුන්ට ලියන ලද ලිපියෙහි සඳහන් ලෙසටම ක්‍රිස්තුස් වහන්සේ තුළ පැවති ජීවිතාකල්පය ම ඔහු තුළ ඇය තුළ තිබිය යුතුමය.**

මේ සත්‍යතාවයට ඇතුළු වීමට සෑම කිතුනුවෙකුයම හැකියාවක් නොතිබෙන්නට පුළුවන. එහෙත් ප්‍රසාද ස්නාපනය සක්‍රමේනතුව තුළින් ලැබුන දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල මුල් කරගෙන, අප තුළ සඳහටම වැඩ සිටින ශුද්ධාත්මයාණන්ට නිරන්තරයෙන් අවදිවන තරමට (ශු.ජුවාම් 14:16-17) මෙන්ම දේව වචනයට සවන් දීම, දේව වචනය කියවීම, දිව්‍ය පූජාවට අභ්‍යන්තරයෙන්ම ඇතුළු වීම මෙන්ම, නිරන්තර යාච්ඤා ජීවිතය මෙන්ම සක්‍රමේනතු හරහා විශේෂයෙන් දිව්‍ය සත් ප්‍රසාද වහන්සේ භක්තියෙන් ගෞරවයෙන් ලබාගැනීම සහ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අබිමුවෙහි පෙනී සිටීම තුළින් මෙම අභිරහස්මක සත්‍යතාවයට සෑම කිතුනුවෙකුට ඇතුළු විය හැක.

එසේ නම් කිතු දන පුබුදු අයැදීමේ සේවකයන් වශයෙන් මෙම මාසය පුරාවටම මේ මහා සත්‍යතාවයට පුබුදු ඇතුලතුන්ට මෙන්ම සෑම කිතුනුවෙකුටම ඇතුළු වීමට අවැසි ශුද්ධාත්ම බලය පතා අඛණ්ඩව අයැදීමෙන් සමිඳුන් අභියස පෙනී සිටිමු.

**"එබැවින් යමෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම් එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහව ගොස් ඇත. දැන් සියලල්ම අලුත් වී තිබේ"** ( 2 කොරින්ති 5:17)

පළමු සතිය - දිව්‍යමය කියවීම - පිලිප්පි 2:1-15
අයැදීමට විශේෂ යොමුව :

ජේසු ක්‍රිස්තුන් වහන්සේ තුළ පැවති ජීවිතාකල්පයම සෑම කිතුනුවෙකු තුළම ඇතිවන ලෙස මොර ගසා යාච්ඤා කරමු. ( විනාඩි 10 ක් පමණ)

වෙනත් අයැදීම්
* කිතුනු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්
* කිතුනුවන්ට පීඩා කරන සියළු දෙනා වෙනුවෙන්.
* කිතුනු ජීවිතය ගත කිරීමට මෙන්ම සක්‍රමේන්තු ලබා ගැනීමට ආසාවෙන් සිටින, එහෙත් විවිධ දුෂ්කරතාවයන් නිසා ඊට සහභාගි වීමට නොහැකි වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* කිතුනු දහම වැළඳ ගැනීමට ආසාවෙන් සහ බලාපොරොත්තුවෙන් සිටින සියළු දෙනා වෙනුවෙන්.
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්.
* සුවාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

දෙවන සතිය- දිව්‍යමය කියවීම - 2කොරෙන්ති 5:16-21
අයැදීමට විශේෂ යොමුව :

කාදිනල් තුමන් විසින් කිතු දන පුබුදුවේ ආත්මික අධ්‍යක්ෂක වශයෙන් පත් කර ඇති ගරු රොබින්සන් විජේසිංහ පියතුමන්ට දිවැසි එකතුව හා එක්වී පුබුදු ජනතාව ඉදිරියටම රැගෙන යාමට අවැසි ශුද්ධාත්ම ප්‍රඥාව ඉල්ලා යාච්ඤා කරමු. (විනාඩි 5ක් පමණ)
වෙනත් අයැදීම් :
* ශුද්ධෝත්තම පියාණන් ඇතුළු සමස්ත රදගුරු, පූජක, පැවිදි සහ ධර්මදූත සේවාවේ නියැලෙන සියළු දෙනා වෙනුවෙන්.
* අගෝස්තු මස 11,12,13,14,15 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන භාග්‍යවන්ත අම්මා සහ සක්‍රමේන්තු පිලිබඳ ධර්ම විවේකය වෙනුවෙන්. ඊට සහභාගි වෙන ජනතාව සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* පුබුදු තරුණ තරුණි අංශයන් වෙනුවෙන්.
* ජුසේ වාස් මෙහෙයුමේ නියැලෙන සියළු දෙනා සහ ජුසේ වාස් මුනිතුමන්ගේ දුකකාර්යය සඳහා දියත් කර ඇති නාට්‍ය කණ්ඩායම වෙනුවෙන්.

* පසුගිය ත්‍රස්ත ප්‍රහාරයන් නිසා දැනටමත් ඔත්පල වී සිටින සහ වෛද්‍ය ප්‍රතිකාර ලබන සියළු දෙනාද, එයින් මානසික පීඩනයට පත් වී ඇති සියළු දෙනා සහ ඔවුන්ට විවිධ අන්දමින් උපස්ථාන කරන සියළු දෙනා වෙනුවෙන්.
* අගෝස්තු 20 වන අඟහරුවාදා පෙ.ව.09.00 සිට ප.ව.04.00 දක්වා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන විදේශ ගත වී නිවාඩුව සඳහා ලංකාවට පැමිණ සිටින අයගේ එකතුවට සහභාගි වන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

තෙවන සතිය - දිව්‍යමය කියවීම - හෙබ්‍රෙව් 12:1-6
අයැදීමට විශේෂ යොමුව :

දෙවියන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසයෙන් ඈත් වී ලෞකික සම්පත් ඵල ප්‍රයෝජනය සඳහා විවිධ දෙවි දේවතාවන් සරණ යන සියළුම කිතුනුවන්ගේ සිත් හැරීම සඳහා.
(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* අගෝස්තු 21 වන බදාදා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන සුමැදි මව්වරුන්ගේ එක්දින ධර්ම විවේකයට සහභාගි වන සියළු දෙනා සහ වචනයේ සේවකයා වෙනුවෙන්.
* අයැදීම් එකතුවට සම්බන්ධ සියළු දෙනා සහ අයැදීම් සහයක එකතුව වෙනුවෙන්.
* දුරස්ථර ප්‍රදේශවල සිටින පුබුදු සංඝයේ සියළු දෙනා වෙනුවෙන් සහ ඔවුන්ට උදව් වන සියළු දෙනා වෙනුවෙන්.
* පිලිකා, වකුගඩු, හෘද්‍යාබාධවලට භාජනය වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

සතරවන සතිය - දිව්‍යමය කියවීම - ශු.මතෙව් 5:1-12
අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :
* පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* ඔතු මුදල් හෙවත් පිදුම් පුදන සියළු දෙනා වෙනුවෙන් සහ විවිධ අන්දමින් පුබුදුවට උදව් කරන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

විශේෂ අවධානය සඳහා :

සෑම සිකුරාදා දිනකම යාච්ඤාවේ උපවාසයේ සහ නිරන්තර යැදුමෙන් සමිඳුන් අභියස පෙනී සිටින දිනයක් කර ගන්න. ඒ සඳහා කාලසටහනක් සකස් කර ගන්න උදෑසන 05.00 සිට ප.ව.06.00 දක්වා.

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

*****************************